| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ. | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම. | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල නොවේ. | කල්බදු ක්‍රමයට වාහන පවරාගෙන නොමැත. | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයෙන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ. | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම. | අනුකූල වේ. | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම.** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම. | අනුකූල වේ. | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ. | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම.** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ. | | |
| 13.2 | පොදු තැන්පත් සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම. | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ. | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | - | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | - | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | - | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ. | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ. | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම. | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ. | | |
| 18.2 | එම චක්‍රලේඛ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ. | | - |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ. | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහා ම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ. | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා ම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල නොවේ. | 02/2018 රා.ප.ච. පරිදි වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කරනු නොලැබේ. | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ. | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම.** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ. | | |

# ඇමුණුම 01

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ARI/E/MTL/FA/2/24/15

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025 මැයි 26 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

**ශීර්ෂය 122 - සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 122 - සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ , මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ , මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකභාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) 2007 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා බිම් සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රාජ්‍ය ආයතන 5ක් වෙත (මෙම අමාත්‍යාංශයද ඇතුළත්ව) ලබාදී ඇති ප්‍රතිපාදනය රු.මිලියන 10,455.66 වන අතර ඉදිරිපත් වූ තොරතුරු අනුව එදිනට දරන ලද වියදම රු.මිලියන 9,357 ක් වී තිබුණි. ඉඩම් අමාත්‍යාංශය මුදල් රෙගුලාසි අංක 208 ප්‍රකාරව රජයේ ප්‍රතිපාදන වෙන්කර අදාල ආයතන වෙත බෙදා හැරීම පමණක් සිදුකර ඇතත්, මුදල් රෙගුලාසි සංග්‍රහයේ අංක 448,449 සහ 145 හි සඳහන් පරිදි එම ප්‍රතිපාදන ලබාගෙන වැයකළ යුතු හා වගකීම පැවරෙන ආකාරයට ක්‍රියාකර නොතිබුණි. 2024 වර්ෂය සඳහා ලබාදී තිබූ රු.මිලියන 1,000 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 619.5 වැයකර ඇතත් එම වියදම තහවුරුකර ගැනීමට අදාළ තොරතුරු පවත්වාගෙන යාමට හෝ විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනාගැනීමකින් තොරව අමාත්‍යවරයාගේ වියදම්, බිම්සවිය වැඩසටහනට අදාල වියදම් හා ඉඩම් අත්පත් කර ගැනීමේ වියදම් නිවැරදි පුරෝකතනයක් කර නොතිබුණි. 2024 වාර්ෂික කාර්ය සාධන වාර්තාවෙහි පුනරාවර්තන, ප්‍රාග්ධන හා බිම්සවිය, ඉඩම් අත්කර ගැනීම් වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 15 ක් , රු.මිලියන 1000 ක් හා රු.මිලියන 9,000 ක ප්‍රතිපාදන වෙන් වී ඇතත් ඉතිරි වී ඇති ප්‍රතිපාදනය පිළිවෙලින් රු.මිලියන 2.23 ක් ,රු.මිලියන 380.44 ක් හා රු.මිලියන 6,320 ක් විය.

(ඇ) 2024 වැය විෂයයන් 05 ක් සඳහා ලබාදුන් රු.5,050,000 ක ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ද වැය විෂයන් 14 කට වෙන් කරන ලද රු.22,550,000 ක ප්‍රතිපාදනයෙන් රු.13,158,090 ක් එනම් සියයට 50 ත් සියයට 100 ත් අතර ඉතිරිවී තිබුණි.

(ඈ) අමාත්‍යාංශයේ වැඩසටහන 02 හි වැය විෂයයන් කිහිපයක ප්‍රතිපාදනයන් වෙන්කර ගැනීමේදී අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ හැකිද හා සෘජු විදේශාධාර ලැබීම් අධ්‍යයනයකින් තොරව සිදු කිරීම නිසා එනම් වෙන් කළ මුළු ප්‍රතිපාදනය රු.11,857,000,000 කින් වියදම

රු.3,553,314,393 ක් විය. ඒ අනුව ඉතිරිය රු.8,303,685,607 ක් හෙවත් සියයට 70 ක් වී තිබුණි.

(ඉ) මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව එක් වැය විෂයයකින් තවත් වැය විෂයයක් වෙත අවස්ථා 03 කට අදාළව ප්‍රතිපාදන මාරුකිරීම් කර තිබුණද එවායේ ශුද්ධ ප්‍රතිපාදනයන්හි සියයට 49 සිට සියයට 100 දක්වා පරාසයක ඉතිරිවීම් පවතින බව නිරීක්ෂණය විය.

(ඊ) මුදල් රෙගුලාසි 50 අනුව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේ වගකීම, තම දෙපාර්තමේන්තුවට අදාළ කෙටුම්පත් ඇස්තමේන්තු රෙගුලාසි වලට අනුකූලව පිළියෙල කරන බවට වගබලා ගැනීමත්, ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කරන බවටත් ගණන් දීමේ නිලධාරියා වග බලාගත යුතුය. එසේ වුවත් සෘජුවම විදේශ ප්‍රදානයන් මත සිදුවෙන ව්‍යාපෘති සඳහා 122-2-6-2509 වැය විෂයය යටතේ රු.මිලියන 497 ක් වෙන් කර තිබුනද එම ව්‍යාපෘති සඳහා කිසිදු වියදමක් සමාලෝචිත වර්ෂයේදී දරා නොතිබුණි.

(උ) වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් සංවර්ධන ව්‍යාපෘති සඳහා රු.1,857,000,000 ක ප්‍රතිපාදන වෙන් කර රු.252,908,502 ක වියදමක් දරා තිබීමෙන් සංචාරක අංශය සියයට 14 ක පමණ අවම කාර්ය සාධනයක් මට්ටමක් ලබා කර ගෙන තිබුණි.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

අමාත්‍යාංශයේ 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇති වැඩසටහන 2 යටතේ එළඹි රු.38,438,291ක බැරකම් හි වවුචර්පත් ඉදිරිපත් නොවීම මත එහි නිවැරදිතාවය තහවුරුකර ගැනීමට නොහැකිවිය.

3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරීන් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.1.අ ඡේදයේ සඳහන් නිරීක්ෂණය අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදලේ පනතේ 10 හා 16 වන වගන්ති | සේවකයින්ගෙන් අයකර ගත් රු.1,347,947 ක සේවක අර්ථ සාධක අරමුදල් නියමිත පරිදි අදාළ මාසය ඉකුත් වී දින 14 ක් තුළ එම අරමුදලට බැර කළ යුතු වුවත් එසේ බැර නොකර 2024 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පතු ගිණුමෙ රඳවා තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු.රෙ.103(1)ආ,එ හා 104(4) | සොරකම්, වංචා, හදිසි අනතුරු යනාදී හානිවීම් සම්බන්ධයෙන් පොලීසියට වාර්තා කිරීම හා උචිත අවස්ථාවලදී බැංකුව,රක්ෂණ සමාගම, ඇප සහතිකකරුවන් යනාදීන් වෙත හිමිකම් පෑම් ඉදිරිපත් කිරීම කළ යුතු වුවත් 2022 අප්‍රේල් 19 දින අංක PD – 2791 දරන කැබ් රථ අනතුර සම්බන්ධයෙන් පොලීසියට හා අදාල රක්ෂණ සමාගමට වාර්තා කර නොතිබුණි.එසේම එම අනතුර සම්බන්ධයෙන් වූ අවසන් පරීක්ෂණ වාර්තාවට අනුව එම අලාභය රථය අනියුක්ත කර තිබුණු නිලධාරියාගෙන් අයකර ගැනීමට නිර්දේශ කර තිබියදි රු.475,000 ක් වූ වියදම අමාත්‍යාංශය වැයකර අලුත්වැඩියා කර ඇතත් එම අලාභය 2025 මාර්තු 21 දින වන විටත් අයකරගෙන නොතිබුණි |
| | ii. මු.රෙ.104(1) ප්‍රකාරව පාඩුවක් හෝ අලාභ හානියක් සිදුවූ වහාම එහි ප්‍රමාණය හා හේතුව නිශ්චිත වශයෙන් දැන ගැනීමත්, එයට වගකිව යුත්තන් නිශ්චය කිරීමත් සඳහා ප්‍රාරම්භක පරීක්ෂණයක් වහාම ආරම්භ කළ යුතු වුවත් 2024 මාර්තු 30 දින අංක PH -0668 වාහනයට සිදුවූ අනතුර සම්බන්ධව ප්‍රාරම්භක පරීක්ෂණයක් සිදුකිරීම සඳහා පරීක්ෂණ කමිටුව පත්කිරීම 2024 ජූනි 13 දින සිදු කර තිබුණි.තවද අනතුරට සම්බන්ධ රියදුරුගේ සේවය කිසිදු නිර්දේශයකින් තොරව අවසන්කර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | | | මු.රෙ.104(4) ප්‍රකාරව පාඩුවක් හෝ අලාභ හානියක් සිදු වූ දිනයේ සිට මාස තුනක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් විගණිත දිනය වූ 2025 අප්‍රේල් 10 දින වන විටද පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි. තවද මේ පිළිබඳව මු.රෙ.103 ප්‍රකාරව අලාභය හානි පිළිබඳ ලේඛනයේ සටහන් කර නොතිබුණි. |
| | (ii) | මු.රෙ. 109(1) | මු.රෙ. 109(1) උපදෙස් ප්‍රකාරව පඩිහාර,රක්ෂණ, ඇප යනාදිය වැනි සියලුම මාර්ගවලින් අයකර ගත යුතු මුදල් ප්‍රමාණයක් තීරණය කිරීමද ඇතුළුව සියලුම ප්‍රාරම්භක කටයුතු වෙනුවෙන් කරනු ලැබීමෙන් පසු හානියෙන් අයකර ගත යුතු උපරිම වටිනාකම හා අයකර ගැනීමට තීරණය කරන ලද මුදල අතර වෙනස්කම් නිරීක්ෂණය විය.එනම් අවස්ථා 05 කදි රු. 1,367,600 ක ශේෂයක් එසේ කපාහැර නොතිබුණි. |
| | (iii) | මු.රෙ.1645 හා 1647 (ආ) | ක්‍රමවත් ලෙස හා විධිමත් ලෙස සම්පූර්ණ කර වාහන ලොග් සටහන් පොත් පවත්වාගෙන යා යුතු වුවත්, අමාත්‍යාංශයට අයත් වාහන සම්බන්ධයෙන් පවත්වාගෙන යන ලොග් පොත්වල වාහන පිළිබඳ විස්තර, දැවෙන ඉන්ධන ප්‍රමාණය, වාර්ෂික බලපත්‍ර පිළිබඳ විස්තර, හදිසි අනතුරු පිළිබඳ විස්තර, රියදුරන් මාරු කිරීම් පිළිබඳ විස්තර හා ගමන් පිළිබඳ මාසික සාරාංශ යනාදිය විස්තර පිළිබඳව සටහන් කර යාවත්කාලීන කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 සහ 4.6 වගන්ති | | සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 02 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 251,476 ක ණය ශේෂය ප්‍රධාන ණයකරුගෙන් අයකර ගත නොහැකි අවස්ථාවලදී අනුගමනය කළ යුතු යැයි නියම කොට ඇති ක්‍රියාමාර්ග ඇපකරු සම්බන්ධයෙන් ගත යුතු අතර ප්‍රධාන ණයකරු මියගොස් ඇත්නම් සහ ඔහුගේ උරුමක්කාරයන්ගෙන්ද අයකර නොගත් වර්ෂ 01 - 03 ත් අතර පැරණි ණය ශේෂයන් පවතින බව නිරීක්ෂණය විය. |
| (ඈ) | 1992 අගෝස්තු 19 දිනැති අංක 26 /92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | රජයේ වාහන වල රාජ්‍ය ලාංඡනය යෙදිය යුතු බව සඳහන් වුවද අමාත්‍යාංශයේ වාහන වල එම ලාංඡනය ප්‍රදර්ශනය කර නොතිබුණි. |

3.5 අවිධිමත් ගනුදෙනු

(අ) සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා වෙත රජයේ නිල නිවාසය රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් 2022 අගෝස්තු 23 දින ගිවිසුම් පත්‍රයක් මගින් ලබාදී තිබුණු අතර එම ගිවිසුම් පත්‍රයේ 07 වන වගන්තිය ප්‍රකාරව නිවසට අදාළ විදුලිය ජලය හා දුරකථන සේවා සැපයීම වෙනුවෙන් වූ බිල්පත් අමාත්‍යවරයාගේ පෞද්ගලික වියදමින් ගෙවීම් කළයුතු වුවත් නිල නිවසට අදාළ ජල හා විදුලිය බිල්පත් වෙනුවෙන් 2024 වර්ෂය තුළ රු.1,062,665 ක මුදලක් සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ වියදමින් ගෙවීම සම්බන්ධයෙන් මු.රෙ. 135 ප්‍රකාරව බලය දීම, අනුමත කිරීම, නිර්දේශ කිරීම හා ගෙවීම සම්බන්ධ නිලධාරීන් වගකිව යුතු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) 2024 වර්ෂයේ පැවැත් වූ ලෝක ඉඩම් සමුළුව සඳහා සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ එවකට සිටි ලේකම්වරයා,ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් හා ඉඩම් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ඉඩම් ප්‍රතිපත්ති යන නිලධාරීන් තිදෙනා සහභාගි වූ අතර එම සමුළුව සඳහා ගමන් වියදම්, ලියාපදිංචි ගාස්තු, ගුවන් ටිකට්පත් ගාස්තු, ගමනා ගමන පහසුකම්, නවාතැන් පහසුකම් හා ආහාර පාන ලබාදෙන බවට ලෝක බැංකුවේ ශ්‍රී ලංකා හා මාලදිවයින් කළමනාකරුගේ 2024 මාර්තු 13 දිනැති ලිපියෙහි සඳහන් වී තිබුණි. එමෙන්ම භාණ්ඩාගාර ලේකම්වරයා විසින් 2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 6 වන ඡේදයේ සඳහන් පරිදි විදේශීය අනුග්‍රාහක ආයතනය විසින් පූර්ණ පිරිවැය දරන්නේ නම් මිස විදේශීය අධ්‍යයන/පුහුණු/සම්මන්ත්‍රණ සඳහා නිලධාරීන් සහභාගී නොකළ යුතුය යන්න සඳහන්ව තිබුණු අතර,මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 01/2015/01 හා 2015 මැයි 15 දිනැති චක්‍රලේඛයේ 04 (අ) වගන්තිය ප්‍රකාරව නවාතැන් හා ආහාර පාන සඳහා වූ වියදම් විදේශ රජය හෝ ප්‍රදාන ආයතනය විසින් නොදරනු ලබන විටදී පමණක් සංයුක්ත දීමනා ලබාගත හැකි වුවත්, එක් නිලධාරියකුට සංයුක්ත දීමනාව එක් දිනකට ඇ.ඩො. 129.85 බැගින් දින 09 ක් සඳහා රු. 714,980 ක් (357,490X2) ගෙවා තිබුණි.

(ඇ) බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක නොවන ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත අමාත්‍යාංශය ප්‍රතිපාදනයෙන් රු.මිලියන 50 ක් 2024 වර්ෂයේදී වෙන්කර ඇතත් ඉන් රු.මිලියන 0.92 ක් පමණක් වියදම් කර රු.මිලියන 48.6 ක් ඉතිරිවී තිබුණි.එම මුදල බිම්සවිය වැඩසටහන සඳහා වැයකර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය .

3.6 තැන්පතු

(අ) අමාත්‍යාංශ පොදු තැන්පත් ගිණුම තුළ 2024 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ක් ඉක්මවූ තැන්පතු ලෙස රු. 1,552,723 ක ශේෂයක් පැවති අතර ඉන් රු. 122,470 ක් කල්ඉකුත් වූ

වූ අතර එවා රාජ්‍ය ආදායමට බැර නොකර එම ගිණුමේ රඳවා තබාගෙන ඇති බව නිරීක්ෂණය විය.

(ආ) ඇප තැන්පත් ගිණුම් අංක 6000-0-0-1-108 හි වසර දෙකකට අධික කාලයක් රඳවා ගත් වටිනාකම රු.115,118 ක තැන්පතු රාජ්‍ය ආදායමට බැර නොකර තිබුණි

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලැසුම් කිරීම

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සකස් කල ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්ක හා ප්‍රගතිය, වාර්තාවෙහි සඳහන්වන පරිදි අමාත්‍යාංශයේ වැඩ කොටස් පාලන අංශය, ඉඩම් සංවර්ධන අංශය, අත්පත් අංශය, ප්‍රතිපත්ති අංශය, ව්‍යාපෘති අංශය සහ සැලසුම් අංශය ලෙස අංශයන් බෙදා තිබුණද එක් එක් අංශය මඟින් ඉදිරි වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට සකස් කල අංශික සැලසුම් හා කාර්යයන් අයවැය ඇස්තමේන්තු සඳහා යෝජනා ඇතුළත් ලිපිගොනුවෙහි නොතිබුණි.

4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට කාබනික පොහොර ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 350 ක් අමාත්‍යාංශය ප්‍රතිපාදන ලබාදී ඇතත් එම ව්‍යාපෘතිය ශක්‍යතා අධ්‍යනයකින් සහ නිසි අධීක්ෂණයකින් තොරව ක්‍රියාත්මක වී මේ වන විට සම්පූර්ණයෙන්ම නතර වී ඇත. එහි සිදුවී ඇති අක්‍රමිකතාවයන් සෙවීම සඳහා වර්තමානයේ විශේෂ විමර්ශන කමිටුවක් පත්කර ඇතත් එම කමිටු වාර්තාව මේ දක්වා නිමකර නොතිබුණි.එම ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් මාසයෙන් පසුව ඉඩම් අමාත්‍යාංශය වෙත පවරා ඉතිරි මුදල වූ රු.1,864,606 ක් අමාත්‍යාංශයේ ගිණුමට ලැබී පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණි.කෙසේ නමුත් මෙම මුදලින් නැවත කොමිෂන් සභාව විසින් EPF, ETF සහ කාබනික පොහොර මධ්‍යස්ථාන වල විදුලි බිල්පත් ගෙවීම් කිරීම වෙනුවෙන් ඉල්ලුම් කල රු.1,659,834 ක් නැවත කොමිෂන් සභාවට ලබාදී තිබුණි.

(ආ) බිම්සවිය වැඩසටහන 1998 වර්ෂයේදී නියාමන වැඩසටහනක් ලෙස ආරම්භවී වර්තමානය වනවිට වසර 26 ක් ගතවී දරා ඇති වියදම රු.මිලියන 9,357 ක් විය. හිමිකම් සහතික ලබාදී ඇති සංඛ්‍යාව 462,922 ක් වන අතර ගැටලුකාරී ලෙස පැවති ඉඩම් කැබලි වලට අදාළව පසෙක තබා ඇති ලිපිගොනු සංඛ්‍යාව 500,739 ක් වීය. දිවයිනපුරා මෙම වැඩසටහන් ක්‍රියාත්මක වීමට හා සහතික නිකුත් කිරීමට ඉඩම් කැබලි මිලියන 16 ක් පැවතීමත් මෙම ඉඩම් කැබලි ප්‍රමාණයට හිමිකම් සහතික ලබාදීමට ඉදිරියට වසර 66 ක් ගත වන අතර ඒ සඳහා දළ වශයෙන් රු. මිලියන 60,000 ක් පමණ වැය වන විගණනයේදී නිරීක්ෂණය විය.

මෙම වැඩසටහන සාර්ථකව සිදුකිරීම සඳහා කිසිදු වැඩපිළිවෙලක් අමාත්‍යාංශය සකස් කර නොතිබුණි

(ඇ) අමාත්‍යාංශය වාර්ෂික කාර්ය සාධන වාර්තාව අනුව අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු, ආයතන, සභාවන් සහ මණ්ඩල වශයෙන් ආයතන 8 ක පරිපාලන කටයුතු භාරව පැවතියද ඒවායේ සමස්ථ කාර්යසාධනය ඉතාමත් අඩු මට්ටමක පැවතීම රටේ සංවර්ධන අවශ්‍යතාවයට ජාතික වැදගත්කමක් ඇති ඉඩම් අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධ අනෙකුත් ආයතන කඩිනම් තීරණ ගැනීමට බාධාවන් ලෙස පවතී. පනත් හා නීතීන් 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද කාර්යයන් 12 ක් පිළිබඳව එම වාර්තාවෙහි සඳහන් වුවද 2024.12.31 දින ඉදිරිපත් කරන ලද වාර්තාව අනුව කාර්යයන් 07 ක් හැර අනෙකුත් කරුණු 11 ට අදාළව කාර්යභාරය අවසන් වී නොමැති විගණනයේදී නිරීක්ෂණය විය. එම කාර්යභාරයන් පහත පරිදි දැක්විය හැකිය.එනම්

- 1931 අංක 20 දරන ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනතට අදාළව රෙගුලාසි සංශෝධනය කිරීම
- 1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥා පනත සංශෝධනය කිරීම
- 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතට අදාළව රෙගුලාසි සංශෝධනය කිරීම
- 1950 අංක 09 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත සංශෝධනය කිරීම
- 1969 අංක 21 දරන මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය ස්ථාපනය කිරීමේ පනත සංශෝධනය
- 1979 අංක 43 දරන රජයේ ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම
- 2002 අංක 17 දරන මැනුම් පනතට අදාළව රෙගුලාසි සංශෝධනය කිරීම
- ජාතික ඉඩම් කොමිෂන් සභා පනත සම්පාදනය කිරීම
- ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් පනත සම්පාදනය කිරීම
- යෝජිත නව ඉඩම් පනත සම්පාදනය කිරීම
- ඉඩම් පරිපාලනය සම්බන්ධ ලෝක බැංකු වැඩසටහන

4.1.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල 7ක ව්‍යාපෘති 12 කට ලබාදුන් රු.228,965,254 ක ප්‍රතිපාදන,2024 දෙසැම්බර් 31 වන විටත් එම ව්‍යාපෘති ආරම්භ නොකිරීම මත අමාත්‍යාංශය විසින් එම මුදල් නැවත පවරා ගෙන තිබුණි.

(ආ) ඇස්තමේන්තුගත වියදම රු.100,000,000 ක්වූ ලන්දේසි කොටුව අලුත්වැඩියා කිරීමේ (කල්පිටිය සහ මන්නාරම) ව්‍යාපෘතිය සඳහා රු.2,780,288 ක් වියදම් දරා තිබූ අතර එය සියයට 2 ක් වූ ඉතා අවම කාර්යසාධන මට්ටමක් ලගාකර ගෙන තිබුණි.

(ඈ) අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන උද්භිද උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු.55,000,000 ක ප්‍රතිපාදනයක් ලැබී ඇතත් එහි කිසිදු කාර්ය සාධනයක් අත්කර ගෙන නොතිබුණි.

(ඇ) කිතුල්ගල සංචාරක තීරය සංවර්ධනය කිරීම යටතේ වූ ව්‍යාපෘති 02 ක් වෙනුවෙන් වෙන්කල රු.24,103,672 ක ප්‍රතිපාදන සඳහා කිසිදු කාර්යයක් ආරම්භකර නොතිබුණි.

(ඉ) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් සිදුකරනු ලබන ඇස්තමේන්තුගත වටිනාකම රු.16,712,298 ක් වූ හිරිවඩුන්න පාලම අසල සිට පින්නවල අලි අනාථාගාරය දක්වා ඇවිදින මංතීරුවේ ඉතිරි කොටස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට සමගාමීව සිදුකල යුතු වීදිපහන් සවිකිරීම මුල් සැලසුම් තුල අන්තර්ගත නොවීම මත ඇස්තමේන්තු සංශෝධනය කිරීමට සහ අනුමැතීන් ලබා ගැනීමට කාලයක් ගතවීමෙන් එම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකිවී තිබුණි.

## 5 වත්කම් කළමනාකරණය

### 5.1 කාර්යාල ලී බඩු හා උපකරණ

2021 වර්ෂයේදී රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට අයත් නිල නිවස සඳහා මෙම අමාත්‍යාංශ වියදමින් ලී බඩු හා උපකරණ අයිතම 17 ක් මිලදී ගෙන ලබා දී ඉඩම් අමාත්‍යාංශයේ ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සහ ජංගම නොවන වත්කම් ලෙස සටහන් කර ඇති අතර එම ලී බඩු හා උපකරණ තොගය විධිමත්ව නිල නිවස හිමි අමාත්‍යාංශය වෙත පැවරීම හෝ වාර්ෂිකව සිදුකරන භාණ්ඩ සමීක්ෂණයක් හෝ සිදුකර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

### 5.2 වාහන පාලනය

(අ) අමාත්‍යාංශය සතු වාහන 31 කින් 06 ක් වෙන්කල වාහන වන අතර ඉතිරි 25 සංචිත වාහන වේ. 2024 දෙසැම්බර් 31 දින වන විට සේවය කරන රියදුරන් ගණන 14 කින් 07 දෙනෙකු වෙන්කල වාහන වල ද අනෙක් රියදුරන් 07 ඉතිරි සංචිත වාහන 25 සඳහා යොදවා ඇත. කණ්ඩායම් ප්‍රවාහන සේවයේ යොදවා ඇති වාහන 10 ධාවනය සඳහා ඉන්ධන, අළුත්වැඩියා,ටයර්, බැටරි ආදී අළුත්වැඩියා සඳහා දරන ලද වියදම රු.19,019,604 ක් වී තිබුණි. ඇතැම් වාහන ඉතා අඩු ධාවනයක් පවතින අතර වාහන නිවැරදිව උපයෝජනයක් සිදු නොවන තත්වයක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. මුදල් අමාත්‍යාංශය විසින් 2022 අප්‍රේල් 26 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 08/2022 දරන චක්‍රලේඛය හා 2024 ජනවාරි 10 දින ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 දරණ චක්‍රලේඛය නිකුත් කරමින් ද රජයේ වියදම් සීමා කිරීමට උපදෙස් ලබා දී ඇතත් ඉන්ධන

වියදම් ලෙස රු.11,877,422 ක්ද ,නඩත්තු හා අළුත්වැඩියා වියදම රු. 31,127,466 ක්ද වී තිබීම මත කි.මී. එකක් ධාවනය කිරීම සඳහා දරා ඇති වියදම ඉතා ඉහළ අගයක් ගෙන තිබුණි. එසේම දැනට භාවිතා කරන වාහන පැරණි ඒවා වීමත් නඩත්තු වියදම් අධික වාහන භාවිතයෙන් හා වාහන අළුත්වැඩියා සිදු කරනු ලබන ආයතන ඉහළ මිළ ගනන් ඉදිරිපත් කිරීමත් නිසා වාහන අළුත්වැඩියා වියදම 2024 වර්ෂයේදී රු.25,832,435 ක් වී තිබුණි.

(ආ) 2024 ජූනි මාසයේදී සංචාරක ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙත තාවකාලිකව පවරන ලද KX-5973 දරණ වාහනය 2024 නොවැම්බර් 19 දින නැවත අමාත්‍යාංශය වෙත භාරදෙන අවස්ථාව වන විට සංචාරක අංශය විසින් කි.මී.6,510 ක දුරක් ධාවනය කර එහි අළුත්වැඩියා කටයුතු සඳහා රු.2,173,663 ක මුදලක් සංචාරක අංශය විසින් දරා තිබුණි. ඉඩම් අමාත්‍යාංශය වෙත භාරදුන් මෙම වාහනය 2025 මාර්තු 14 දින වනවිට ධාවන තත්ත්වයේ නොමැති බැවින් අළුත්වැඩියා කටයුතු සඳහා නැවතත් ඉන්දික මෝටර්ස් ආයතනය වෙත භාරදී එම ආයතනය විසින් රු.391,500 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි.එම ඇස්තමේන්තුවෙහි සඳහන් වන පරිදි වාහනයේ බඳෙහි සීරීම් හා තැලීම් නිසා සිදුවූ හානි යථා තත්ත්වයට පත් කිරීම සඳහා රු.241,000 ක් වැය වන බවත් මෙම අළුත්වැඩියාව වාහන භාවිතා කරන ලද නිලධාරීයාගේ හෝ රියදුරාගේ නොසැලකිලිමත්කම නිසා සිදුවී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන පරිදි පරීක්ෂණයක් සිදුකර අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතු බවද විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) 2025 ජනවාරි 27 දිනැති MT/IAI/1/7/1 – 2024 දරණ අභ්‍යන්තර විගණන වාර්තාව අනුව සංචිත වාහනයක් වන PF 6977 දරණ කැබ් රථයෙන් රු.139,321ක් වටිනා ඉන්ධන ලීටර් 439.5 ක් අවභාවිතා කර ඇති බව හෙළිදරව් වී ඒ පිළිබඳ දින 14ක් ඇතුළත වාර්තාවක් අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලෙස 2025 ජනවාරි 30 දින T/IAI/1/7/IAQ – 2025 දරණ ලිපිය මගින් අතිරේක ලේකම් (පාලන) වෙත දන්වා තිබුණ ද, 2025 මාර්තු 05 විගණන දින වන විටත් එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) සංචාරක අමාත්‍යාංශය සතු අංක CAU – 4004 දරණ ජීප් රථය 2019 වර්ෂයේදී අනතුරකට ලක්වී එම අනතුරෙන් පසුව ශ්‍රී ලංකා සංචාරක සම්මේලනය කාර්යාංශය වෙත භාරදී 2023 නොවැම්බර් 23 දින රු.11,516,808 ක අලුත්වැඩියා වියදමක් එම කාර්යාංශය මගින් සිදු කර වසර පහක කාලයක් භාවිතා කිරීම සඳහා කාර්යාංශයට පවරා දී නැවත 2024 නොවැම්බර් 25 දිනැති අංක MT/ADM/02/06/08/V දරණ ලිපිය මගින් අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර ඇතත්, රජයේ දේපලකට සිදුවූ හානිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 102,104,105 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.එසේම මෙම ජීප් රථය වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 වන විට සම්මේලනය කාර්යාංශය විසින් වැය කර තිබුණු රු.මිලියන 12.4 ක මුදල ප්‍රතිපූර්ණය කිරීමට අමාත්‍යාංශය කටයුතුකර නොතිබුණි.

(ඉ) සංචාරක අමාත්‍යාංශය භාරයේ පවතින GH- 3129 දරණ මෝටර් රථය 2023 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත්කර තිබුණද එම රථයේ අයිතිය වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සතුව පවතින බැවින් අපහරණ ක්‍රියාවලිය සිදුකිරීමට නොහැකි වී තිබුණි. මෙම මෝටර් රථය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

## 5.3 අනාර්ථික ගනුදෙනු

(අ) සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා වෙත රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් වෙන් කරන ලද නිල නිවස 2024 වර්ෂයේදි මෙම අමාත්‍යාංශය මගින් අලුත්වැඩියාව සිදුකර ඒ සඳහා රු.1,058,995 ක් දරා තිබුණි.අදාල වියදම එම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ සිදු නොකර මෙම අමාත්‍යාංශය වැය විෂයයන් මගින් සිදුකිරීම විධිමත් බලය නොමැති ගනුදෙනුවක් බව විගණනයේදි නිරීක්ෂණය වන අතර එම මුදල් ප්‍රතිපූරණය කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) උරුමය වැඩසටහන ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ජනාධිපති ලේකම් කාර්යාල වැය ශීර්ෂ 001-02-06-021-2509 යටතේ ඉඩම් අමාත්‍යාංශයට රු.මිලියන 18.83 ක්ද ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට රු.මිලියන 111.58 ක් ලෙස මුළු ප්‍රතිපාදනය රු.මිලියන 130.41 ක් ලබාදී ඉන් අමාත්‍යාංශය රු.මිලියන 14.48 ක් හා දෙපාර්තමේන්තුව රු.මිලියන 71.88 ක් දරා තිබුණි. දරන ලද මුළු වියදම රු.මිලියන 86.36 ක් වුවද මෙම වැඩසටහන යටතේ 2024 වර්ෂය තුළ ලබාදීමට සැලසුම්කරන ලද ඔප්පු ප්‍රමාණය 40,000 ක් වුවත් සත්‍ය වශයෙන් ලබා දුන් ප්‍රමාණය ඔප්පු 22,362 ක් විය. මෙම වැඩසටහන කඩිනම් වැඩසටහනක් ලෙස ආරම්භ කිරීමෙන්, දිරිදීමනා වෙනුවෙන් අමාත්‍යාංශ රු.මිලියන 5.04 ක් හා දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 7.26 ක් ලෙස එකතුව රු.මිලියන 12.3 ක් වැයකර ඇතත් දිරිදීමනා ගෙවීමට රේටයන් ගණනය කිරීම හා නිලධාරීන් විසින් රාජකාරි කාලය තුළ ඉටුකරනු ලැබූ උරුමය ඔප්පු ලබාදීමේ කටයුතු සඳහා දීමනා ලබාදීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 5.4 කළමනාකරණ දුර්වලතා

(අ) 2024 ජනවාරි මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලය වෙත රු.11,139,436 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ගෙවීම් කර ඇතත් රාජකාරියට පැමිණීම,පිටත්වීම හා රාජකාරි ස්ථානයෙන් බැහැරයාමට පූර්ව අනුමැතිය ලබාගත් බවට ලිපි මගින් ඔවුන්ව විධිමත් අධීක්ෂණයක් කිරීමට අවශ්‍ය ලේඛන පවත්වා නොතිබුණු අතර රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් 2017 අප්‍රේල් 19 දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2017 පරිදි හා 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009 හා 2009 ජුනි 17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009(1) අනුව අමාත්‍ය කාර්ය මණ්ඩලය සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍රය භාවිතය නොකිරීම හේතුවෙන් සේවයට වාර්තා කිරීම පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත්

නොවුණි.

(ආ) ඉඩම් අත්පත් කර ගැනීම් ලිපිගොනු 17,048 ක ප්‍රමාණයෙන්, වන්දි ගෙවා අවසන් කර ඇති ලිපි ගොනු ප්‍රමාණය 156 ක් විය.එම ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා සති 149-173 ත් අතර කාලයක් මෙන්ම ඇතැම් අවස්ථාවන්හිදී වසර ගණනාවක් ගතවී තිබුණද ඒ සම්බන්ධ තොරතුරු පද්ධතියක් නොපැවැත්වීම තොරතුරු ලබා ගැනීමට ප්‍රධාන බාධාවක් බව නිරීක්ෂණය කරනු ලැබේ.පසුගිය වසර 05 ක කාලය තුළ රු.මිලියන 21,212.23 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 13,448.43 ක් ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් පොලී හා වන්දි ලෙස ගෙවීම් කර තිබුණි. මෙම සියලුම ගෙවීම් සඳහා මු.රෙ.208 ,448,449 සහ145 හි උපදෙස් ලබා දී තිබුණි.ඉඩම් අත්පත් කර ගැනීමේදී පවතින නීතිරීති රාමුවට අනුව රාජකාරී ඉටු කිරීමේදී දීර්ඝ ප්‍රමාදයක් වර්තමානයට ගැලපෙන පරිදි වෙනස්වීම්වලට ලක් කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

(ඇ) ඉඩම් අත්පත් කර ගැනීමේ අයිතිය හා වගකීම ඉඩම් අමාත්‍යාංශය වෙත පැවරී ඇති අතර එම පවරා ගන්නා ඉඩම රටෙහි සංවර්ධන කාර්යයකට හා පවරාගන්නා අරමුණ සඳහාම භාවිතා කරන්නේද යන්නත් ඉඩම අත්පත් කර ගැනීමෙන් පසුව සංවර්ධන කටයුත්ත සහ සැලසුම් හා ප්‍රතිපාදන සළසා ගැනීම පිළිබඳව අමාත්‍යාංශයේ නිලධාරීන් දැනුවත් වී සිටීම අමාත්‍යාංශයේ වගකීම වුවද කැලණිය හුණුපිටිය ජයන්ති මහල් හන්දියේ පිහිටා ඇති අක්කර 02 පර්චස් 12.40 ක් වූ කුඹුර හා ඇහැළගහවත්ත ඉඩම රජයට පවරා ගැනීම ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 02 වැනි වගන්තිය යටතේ නියමයන් නිකුත් කළද බහුකාර්ය ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අවශ්‍ය මූලික සැලසුම් හා ප්‍රතිපාදන සොයාගන්නා ආකාරය පිළිබඳව නිවැරදි තොරතුරු ලබාගෙන නොතිබුණි.

(ඇ) 1996 ඔක්තෝබර් 31 දින ලංකා වානේ සංස්ථාව සියලුම වත්කම් හා වගකීම් ඇ.ඩො. මිලියන 15 කට පවරා එහි වූ අක්කර 182 ක ඉඩමක් කොරියානු සමාගමක් වෙත ගිවිසුම්ගතව ලබාදී තිබුණද එම විදේශීය සමාගම ගිවිසුම අනුව ක්‍රියාත්මක නොවීම මත මෙම ඉඩම Onyx Heavy Industries and Construction Company Limited වෙත නැවත පවරා 2010 වර්ෂයේදී සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ් ආයතනය ලෙස නාමය වෙනස්කර තිබුණි. රජයේ ඉඩම් ආඥා පනතේ 6(1) වගන්තිය අනුව ඉඩමක් බාහිර පාර්ශ්වයක් වෙත නිදහස් කිරීමට අදාළව සිදුවිය යුතු ක්‍රියාදාමයක් අනුගමනය නොකර විදේශීය සමාගම වෙත ලබාදී තිබුණි.මෙම ඉඩම පැවරීම සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ උපදෙස් මත දීමනා පත්‍රය අවලංගු වන පරිදි කොන්දේසි ඇතුළත් නොකිරීම හා 2022 සිට 2024 වර්ෂය දක්වා කාලය තුළ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී නොදීමත්, නීතිපතිවරයා විසින් ලබා දුන් උපදෙස් පරිදි කොන්දේසි ඇතුලත් කරමින් කර්මාන්ත ශාලාව ක්‍රියාත්මක වන අක්කර 20 ක පමණ ඉඩම් ප්‍රමාණය පමණක් ලබාදීම වඩාත් ඵලදායි බවත් ආරම්භක ගිවිසුමෙහි සඳහන් පරිදි කර්මාන්ත ශාලාවෙහි කටයුතුවල ප්‍රගතියක් දක්නට නොලැබෙන අතර ආරම්භක ගිවිසුම

අනුව ක්‍රියාත්මක නොවන තත්ත්වයක්ද දක්නට ලැබුණි. ඒ අනුව දැනට භාවිතයට නොගත් අක්කර 160 ක ප්‍රමාණය තාක්ෂණය සම්බන්ධ ජාත්‍යන්තර මට්ටමේ උසස් අධ්‍යාපන ආයතනයක් ඇති කිරීමට ව්‍යාපෘති යෝජනාවක් පිළියෙල කරමින් සිටින බව ආයතනයේ ඉහළ කළමනාකරණය විසින් වාචිකව ප්‍රකාශ කළ අතර සැලසුම් මට්ටමෙහි ඇති එම වාර්තාව විගණනයට ඉදිරිපත් නොවිය.

(ඉ) ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් 2018 ජනවාරි 16 දින ප්‍රතිග්‍රහණ ලිපියක් නිකුත් කරමින් මුහුදු වැලි ඉවත් කිරීම සඳහා 2018 ජනවාරි 16 දින Rhode Neilson A/C නොමැති විදේශීය සමාගමක් සමග ගිවිසුමක් අත්සන් කර තිබූ අතර එම කොන්ත්‍රාත්තුවෙහි කොන්ත්‍රාත් වටිනාකම ඇ.ඩො.මිලියන 19.9 ක් විය.ඒ අනුව 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ මුහුදු වැලි කියුබික් මීටර් මිලියන 04 ක් කැනීමට හා ගොඩගැසීමට දෙපාර්ශවය එකඟ වී තිබුණි. ඒ අනුව 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ රු.මිලියන 6,778.04 ක් වටිනාකමට මුහුදු වැලි අලෙවි කර සංස්ථාව විසින් ආදායම් උපයාගෙන තිබුණි. නමුත් 1957 රාජ්‍ය සන්තක ඉඩම් පිළිබඳ ආඥා පනතේ 08 වැනි කාණ්ඩයේ 58 සිට 67 දක්වා වගන්තිවලට අනුව මුහුදු පතුලෙන් යම් ද්‍රව්‍යයක් ලබා ගන්නේ නම් ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් අනුමැතිය අනුව සිදුකළ යුතු බව සඳහන්ව ඇති අතර ඒ සඳහා ගාස්තුවක් අය කළ යුතු බවද සඳහන් වී තිබුණි. නමුත් රු.මිලියන 6,778.04 ක් වූ වටිනා වැලි ඉවත් කිරීමේදී ලබාගත් අනුමැතියක් හෝ යම් මුදලක් රජයට අයකර ගත් බවට සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවුණි. ඒ අනුව මෙම ක්‍රියාවලියේදී අවම වශයෙන්.රු. මිලියන 271.1 කට ආසන්න පාඩුවක් රජයට සිදුවී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඊ) 1982 ඉඩම් අත්පත් කර ගැනීමේ පනතෙහි 38(අ) වගන්තිය ප්‍රකාරව පවරා ගත් 492/D ග්‍රාම නිලධාරි වසමෙහි මු.පි. 9302 පිඹුරෙහි කැබලි අංක 02 දරන ඉඩම් කොටස නේවාසික කටයුත්තක් සඳහා දීර්ඝකාලීන බදුකරයක් මගින් පුද්ගලයෙකු වෙත ලබාදී තිබුණි. ඉඩම් කොමසාරිස් ජනරල්වරයාගේ අංක 4/10/35274 හා පළාත් ඉඩම් කොමසාරිස්වරයාගේ අංක පළාත්/ඉ.කො/06/කො/571 දරන ලිපිය අනුව අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය අනුව 2012 අගෝස්තු 03 දිනැති ගැසට් පත්‍රය මගින් ගැසට් නිවේදනයක් නිකුත් කරමින් මෙම ඉඩම අදාළ පුද්ගලයාට බදු දීමට හැකි බවට ප්‍රසිද්ධ කර තිබුණි. මෙම ඉඩම වසර තිහක කාලයක් සඳහා වාර්ෂිකව රු.800,000 ක මුදලකට බදු දී තිබුණි. 2025 පෙබරවාරි 20 දින වන විට මෙම ඉඩමෙහි නේවාසිකව පදිංචිව නොසිටි අතර වාණිජ නගරයක් වන බත්තරමුල්ල ප්‍රදේශයේ පිහිටි මෙම ඉඩම නේවාසික පදනම් මත බදු දීම වැරදි ක්‍රියාවක් වන අතර මෙම කටයුත්ත සඳහා 2012 ජූලි 11 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ද ඉදිරිපත් කර, තිබුණු අතර මු.රෙ 142 ප්‍රකාරව රජයේ

ආදායම් ඉහළ දැමීම සඳහා මෙම ඉඩම වාණිජ පදනමින් බදු දීම සිදු කළ යුතු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(උ) රජයේ සංවර්ධන කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳව සිදුකරන විගණනයේදී අවස්ථා 05 කට අදාළව ඇස්තමේන්තු අවස්ථාවේදී වන්දි මුදල රු.මිලියන 1,861 ක් වූ අතර අදාල වන්දි ගෙවීම් කරන අවස්ථාවේ එය රු.මිලියන7,464.03 ක් වී තිබුණි.එය අනුමත ඇස්තමේන්තුවට වඩා සියයට 116 සිට සියයට 310 ක් දක්වා වියදම ඉහළ ගොස් තිබුණි.

(ඌ) ගම්පහ දිස්ත්‍රික්කයේ වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ පුද්ගලයකු සතු අක්කර 01 රූඩ් 01 පර්චස් 17.25 ක ඉඩම අත්පත් කර ගැනීමේ විධානය යටතේ තක්සේරු වටිනාකම රු.මිලියනයක් වූ ඉඩම අත්පත් කරගන්නා අවස්ථාව වන විට එහි වටිනාකම රු.මිලියන 153.93 ක් වී තිබුණි.

(එ) ඉඩම් අත්පත් කර ගැනීමේ පනතෙහි 38 වන වගන්තිය යටතේ ආඥාවක් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට වන්දි මුදලට අමතරව පොලියක්ද ගෙවීමට සිදුවන අතර විගණනය විසින් නියදි ලෙස තෝරාගත් අවස්ථාවන් 03 කදී 17 වගන්තිය අනුව ප්‍රදානය කළ මුදල රු.මිලියන 202.31 ක් වූ අතර ඒ සඳහා ගෙවා ඇති සහ ගෙවිය යුතු පොලිය රු.මිලියන 188.54 ක් වී තිබුණි.

(ඒ) ලංකා සංස්ථා සිමෙන්ති කෝපරේෂන් පුද්ගලික සමාගමට ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 224 ජී.පනාහඩුව ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පල්ලේබැද්ද ගමෙහි ඉඩමෙන් හෙක්ටයාර් 94.6174 ක් හෙවත් අක්කර 233 පර්චස් 58 ක ප්‍රමාණයක් වසර 50 ක කාලයක් සඳහා භූමියේ ඛණිජ ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා බදු දීමට තීරණය කර තිබුණි. ඒ අනුව 2022 සැප්තැම්බර් 05 දින රු.මිලියන 6.50 ක මුදලක් ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පළමු කුලී ගාස්තුව ලෙස ලබාගෙන තිබුණි.මෙම ඉඩම බදු දීම සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන 02 ක් විසින් පරිසරයට සිදුවන හානිය හා ගම්වාසීන්ගෙන් එල්ලවූ විරෝධතාවය නිසාත් මෙම ඉඩම බදු දීම සඳහා ගිවිසුම්ගත වීම තාවකාලිකව කල් දමා තිබුණි. ඉහත මුදල ලබාගෙන වසර 02 මාස 07 ක් ගතවී ඇතත් එම මුදල ආපසු ලබාදීමට මෙම වාර්තාවේ දින වනවිටත් කටයුතු කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඔ) 2024 දෙසැම්බර් 05 දිනැති අංක 12/22 වවුචරය මගින් රු.30,000 ක මුදලක් ශ්‍රී ලංකා පරිගණක සංසදය (Computer Society of Sri Lanka) ආයතනය විසින් 2024 නොවැම්බර් 25 සහ 26 දින දෙකෙහි ෂැන්ග්‍රිලා හෝටලයේ පැවති National IT Conference – NITC 2024 සඳහා සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) යන නිලධාරිනිය සහභාගී වීම නිසා ගෙවීම් කර තිබුණි. මෙම ආයතනයේ (President of CSSL) විසින් 2024 ඔක්තෝබර් 10 දින ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත මෙම සම්මන්ත්‍රණ

වැඩසටහන පවත්වන බවට දැනුවත් කර තිබුණද මේ සඳහා යොමු කිරීමට නිලධාරියෙකු අනුමත කර ඇති බවට තොරතුරු නොවීය.එසේම මෙම අවස්ථාව වන විට භාණ්ඩාගාර ලේකම්වරයා විසින් 2024 ජනවාරි 10 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 හි 05 ඡේදයේ පරිදි දේශීය පුහුණු වැඩසටහන් යටතේ කාර්යමණ්ඩල පුහුණු සඳහා වන වියදම් යටතේ දේශීය පුහුණු අවස්ථා ලබාදීමේදී සේවා ව්‍යවස්ථා බඳවාගැනීමේ පරිපාටි හා චක්‍රලේඛ විධිවිධාන අනුව ඒ ඒ නිලධාරීන් විසින් සුදුසුකම් සපුරාලීම වෙනුවෙන් සම්පූර්ණ කළ යුතු අනිවාර්ය පුහුණුවීම් සඳහා පමණක් එම පුහුණු අවස්ථාවන් ලබාදිය යුතු අතර එම පුහුණු කටයුතු පැවැත්වීම සඳහාම පිහිටුවා ඇති දේශීය රාජ්‍ය ආයතන වෙත පමණක් නිලධාරීන් යොමු කළ යුතු බව සඳහන්ව තිබුණි. ඒ අනුව මෙම හෝටලයේ පැවති සම්මන්ත්‍රණ සඳහා මෙම් නිලධාරිණිය සහභාගී කරවීම මු.රෙ.135 ප්‍රකාරව ගෙවීම සම්බන්ධයෙන් බලය දීම, අනුමත කිරීම, නිර්දේශ කිරීම හා ගෙවීම යන කාරණ සඳහා සම්බන්ධ වූ නිලධාරීන් වගකීමට යටත් වන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඹ) අත්තිකාරම් ගිණුම් ශේෂය තුළ නිලධාරීන් දෙදෙනකුගෙන් අයවිය යුතු රු.15,000 ක උත්සව අත්තිකාරම් ණය ශේෂය වසර දෙකකට අධික කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ක) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත යටතේ පාලනය වන ඉඩම් සම්බන්ධයෙන් 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතෙහි 52 වගන්තියෙහි 02 සහ 03 ඡේදයන් අනුව පොලිස්පතිවරයාගේ අත්සනකින් යුතුව 2021 පෙබරවාරි 05 දිනැති අංක 2021 දරණ චක්‍රලේඛය නිකුත් කරමින් විශේෂ පොලිස් ඒකකයක් පිහිටුවා තිබුණි.එවකට සිටි අමාත්‍යවරයා විසින් 2021 පෙබරවාරි 11 දිනැති අංක ML/Gen/stf/02-01 දරන ලිපිය එම පොලිසිය භාරව කටයුතු කරන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, අධ්‍යක්ෂ විමර්ශන වෙත යොමු කරමින් ඉඩම් අමාත්‍යාංශයට අයත් රජයේ ඉඩම් අවභාවිතය පිළිබඳව විමර්ශනයක් කිරීමට යෝජනා කර තිබුණි. අමාත්‍යාංශයට අයත් ඉඩම් පරිපාලනය කිරීම සඳහා නිලධාරීන් පත්කර තිබියදී ඉහත තීරණය ගැනීම ගැටලු සහගත තත්ත්වයක් බව විගණනයේදී නිරීක්ෂණය විය. මෙම ඒකකයේ පිහිටුවීම සඳහා අමාත්‍යාංශයේ 03 වන මහලේ කාමර 02 ක් ලබා දී තිබුණු අතර 2024 ජනවාරි 01 දින සිට අමාත්‍යාංශයේ බිම් මහල වෙත මෙම ඒකකය මාරු කර තිබුණි. එම ඒකකයෙන් සිදු කරන ලද කාර්යයන් වල ප්‍රගතිය හා ගන්නා ලද ක්‍රියාමාර්ගයන් පිලිබඳ තොරතුරු නොතිබුණි.

(ග) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලද කාබනික පොහොර ව්‍යාපෘතිය යටතේ මිලදී ගත් රු.31,027,575 ක් වටිනා වත්කම් පෙර වර්ෂ වල සිට සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන වල වත්කම් යටතේ ගිණුම් ගතකර තිබුණද එම භාණ්ඩ භාරගත් බවට ලැබීම් නියෝග, නිකුතු නියෝග හෝ භෞතික

පරීක්ෂාවක් මගින් නිවැරදිභාවය තහවුරු කර නොතිබුණි.එසේ වුවද එම වත්කම සමාලෝචිත වර්ෂයේ ඉඩම් අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත්කර ඇතත් එම වත්කම් ඉවත් කිරීමට පෙර භෞතික පරීක්ෂාවක් සිදුකර එහි නිවැරදිභාවය තහවුරු කර නොතිබුණි.

(ඩ) ඉඩම් අත්පත් කර ගැනීම් සඳහා වසර 05 ක කාලයක් තුලදී ලැබුණු ප්‍රතිපාදනය රු.මිලියන 21,212.23 ක් වුවද ඉන් නිදහස් කල මුදල රු.13,448.43 ක් වී තිබුණි. එම වටිනාකමෙහි පොලිය සහ වන්දි කොපමණද යන්න වෙන වෙනම හඳුනාගත හැකි පරිදි ලේඛන පැවැත්වීමක් හෝ ගණනය කිරීමක් කර නොතිබුණු අතර විගණනය වෙත ලබා දුන් තොරතුරු අනුව 2023 හා 2024 වර්ෂ දෙක තුලදී පමණක් වන්දි ලෙස රු.මිලියන 3,640.27 ක් හා පොලිය ලෙස රු.මිලියන 1765.96 ක් අදාල කටයුත්ත සඳහා වැය කර තිබිණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නිදහස් කරන ලද ප්‍රතිපාදන වලින් සත්‍ය වශයෙන් ගෙවීම් කරන ලද්දේ කුමන ඉඩම සම්බන්ධවද යන්න සැසඳීමක් සිදුකිරීම සඳහා ගෙවීම සම්බන්ධ සාරාංශ වාර්තාවක් ලබාගන සැසඳීම් සිදුකර නොතිබුණි.

## 6. මානව සම්පත් කළමනාකරණය

### 6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, සත්‍ය කාර්ය මණ්ඩලය

අනුමත හා සත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | අනුමත සංඛ්‍යාව | සත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 29 | 25 | 04 |
| තෘතියික | 05 | 02 | 03 |
| ද්විතියික | 549 | 516 | 33 |
| ප්‍රාථමික | 44 | 37 | 06 |
| වෙනත් | 02 | - | - |
| එකතුව | 629 | 580 | 46 |

(අ) අනුමත ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක්ද, තෘතියික මට්ටමේ තනතුරු 03 ක්ද, ද්විතියික මට්ටමේ තනතුරු 33 ක්ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 06 ක්ද පුරප්පාඩුව පවතී. විගණනය වෙත ලබා දී ඇති තොරතුරු අනුව කාර්ය මණ්ඩලයේ යම්යම් තනතුරුවල පුරප්පාඩු පැවතියද වර්තමානයේදී ඉටුකිරිමට පවතින හා සැලසුම් කරන කාර්යභාරය සමාලෝචනයක් සිදුකර ඒ අනුව තනතුරු සඳහා අනුමැතිය ලබා ගෙන බඳවාගැනීමට කටයුතු කර නොතිබුණි.

පී.කේ.එම්.පී.නෝනිස්

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

නියෝජ්‍ය විගණකාධිපති වෙනුවට